තොරතුරු මාසිකය

**2024 පෙබරවාරි**
**ජනතා විමුක්ති පෙරමුණේ**
**අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.**

# විමර්ශන

**ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!**

# තව දුරටත් කඩාවැටෙන ආර්ථිකය

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2023 වසරේ ද ප්‍රගතියක් අත්පත් කර නොගත් අතර, එය තව දුරටත් අර්බුදයටම තල්ලු වෙමින් පවතී. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා සඳහන් කරන පරිදි මේ වසරේ නිෂ්පාදන ආර්ථිකය තව දුරටත් කඩාවැටුණු ආකාරය අපට මෙතෙක් ඉදිරිපත් කරන ලද සංඛ්‍යාලේඛන මඟින් තහවුරු වේ.**

2022 වර්ෂයේ කෘෂිකාර්මික නිෂ්පාදනයට සාපේක්ෂව 2023 වර්ෂයේ කිසිදු වර්ධනයක් අත්පත් කරගෙන නොමැත. 2022 වසර විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දී, ඉන්ධන අර්බුදයකට ද මුහුණ දී ලබා ගත් නිෂ්පාදනය අත්පත් කරගත නොහැකි වීම විශාල කඩාවැටීමකි. 2022 වසරේ ඔක්තෝබර් දක්වා කාලයට සාපේක්ෂව 2023 වසරේ ඔක්තෝබර් දක්වා කාලයේ රබර්, පොල් සහ වී නිෂ්පාදනය පහත වැටී තිබිණි. ඒ අතර වී නිෂ්පාදනය විශාල ලෙස පහත වැටී තිබිණි. මෙම තත්ත්වය මේ වසරේ සහල් මිල ඉහළ යාමට ද ප්‍රධාන හේතුවක් වී තිබේ. පහත 01 වගුවෙන් දැක්වෙන්නේ එම කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන කෘෂි නිෂ්පාදන කිහිපයක දත්තය. සංඛ්‍යාලේඛන ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික ආර්ථික දර්ශක වාර්තා ඇසුරෙනි.

මෙම නිෂ්පාදනය කඩාවැටීමට අමතරව විදේශ වෙළෙඳාමේ ද ඇති වූයේ අවාසිසහගත තත්ත්වයකි. 2022 වසරේ ඔක්තෝබර් දක්වා කාලයට සාපේක්ෂව 2023 වසරේ අපනයන ආදායමේ විශාල කඩාවැටීමක් සිදු වී තිබේ. එම අපනයන ආදායම කඩාවැටීම නිසා සිදු වන වෙළෙඳ ගිණුමේ අවාසිය මඟහරවා ගැනීමට රජය අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය වූයේ තව දුරටත් ආනයන සීමා කිරීමයි. එය වගු අංක 02 සංඛ්‍යා සටහන මඟින් පැහැදිලි වේ.

2022 මුල් මාස දහයට සාපේක්ෂව 2023 මුල් මාස දහය තුළ පමණක් අපනයන ආදායම ඩොලර් මිලියන 1,135කින් කඩාවැටී ඇති අතර, එය පියවා ගැනීමට උත්සාහ ගෙන ඇත්තේ ආනයන විශාල ලෙස සීමා කිරීමෙනි. ඒ අනුව ආනයන ඩොලර් මිලියන 1,526කින් අඩු කර තිබේ. ආනයන මත යැපෙන ආර්ථිකයකට එලෙස ආනයන සීමා කිරීම විශාල ආර්ථික ගැටලු ප්‍රමාණයක් නිර්මාණය කිරීමට ඉවහල් වේ. නිෂ්පාදනය කඩාවැටීම (සංඛ්‍යාලේඛන මඟින් තහවුරු කර ඇති) ආයතන වැසී යාම, රැකියා අහිමි වීම, ආර්ථිකයේ භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම, දුප්පත්කම ඉහළ යාම වැනි කරුණු ගණනාවකට මෙය සෘජුව බලපානු ලැබේ.

එලෙසම කර්මාන්ත අංශය ද කඩාවැටීමකට ලක් වෙමින් තිබේ. ඒ යටතේ පසුගිය වසරේ සිමෙන්ති නිෂ්පාදනය සහ භාවිතය අඩු වීම තුළ ඉදිකිරීම් කර්මාන්තයේ කඩාවැටීමත්, ඩීසල් පාවිච්චි කිරීමේ ප්‍රමාණය අඩු වීමෙන් ප්‍රවාහණයේ සහ කර්මාන්තවල පසුබෑමකුත් පිළිබිඹු වේ. ඉදිකිරීම් කර්මාන්තය කඩාවැටීම නිසා විශාල කම්කරු පිරිසකට රැකියා අහිමි වීමත් සිදු වී තිබේ.

**වසර දෙකක ජන - සිට ඔක් දක්වා ප්‍රධාන කෘෂි නිෂ්පාදන**
**(වගු අංක - 01)**

| **නිෂ්පාදනය** | **2022 ජන - ඔක්** | **2022 ජන/ඔක්** | **2023 ජන - ඔක්** | **වෙනස** |
|---|---|---|---|---|
| **තේ** | **කි.ග්‍රෑ. මිලියන** | 211.8 | 215.3 | +3.5 |
| **රබර්** | **කි.ග්‍රෑ. මිලියන** | 59.2 | 57.5 | -1.7 |
| **පොල්** | **ගෙඩි මිලියන** | 2,850 | 2,649 | -201 |
| **මාළු** | **කි.ග්‍රෑ. මිලියන** | 326 | 330 | +4 |
| **වී** | **කි.ග්‍රෑ. මිලියන** | 5,149 | 3,392 | -1,757 |

**විදේශ වෙළෙඳාම - ඩොලර් මිලියන (වගු අංක - 02)**

| | **අපනයන** | **ආනයන** | **හිඟය** |
|---|---|---|---|
| **2022 (ජන - ඔක් )** | 11,044 | 15,420 | -4,367 |
| **2023 (ජන - ඔක් )** | 9,909 | 13,894 | -3,985 |
| **කඩාවැටීම** | 1,135 | 1,526 | |

ඉහත වගු අංක 03 සටහන අනුව සිමෙන්ති පාවිච්චිය මාස දහයක් තුළ 25%කින් කඩාවැටී ඇත. ඒ ප්‍රමාණයට සාපේක්ෂව හෝ ඊට වැඩි ලෙස එය ඉදිකිරීම් කර්මාන්තයට බලපානු ඇත. අනෙක් අතට 2022 වසරේ ඉන්ධන අර්බුදයක් තිබියදී පවා අලෙවි වූ ඩීසල් ප්‍රමාණය 2023 වසරේ සිදු නොවීම මේ නිෂ්පාදන සහ කර්මාන්ත අංශයේ කඩාවැටීම මනාව පැහැදිලි කරන්නකි.

**සිමෙන්ති ආනයනය සහ ඩීසල් විකිණීම - ජන / ඔක්**
**(වගු අංක - 03)**

| **භාණ්ඩය** | **ප්‍රමාණය** | **2022** | **2023** |
|---|---|---|---|
| **සිමෙන්ති දේශීය නිෂ්පාදනය** | **මෙ.ටොන්. දහස්** | 2,778 | 2,247 |
| **සිමෙන්ති ආනයනය** | **මෙ.ටොන්. දහස්** | 1,282 | 816 |
| | | 4,060 | 3,063 |
| **ඩීසල් විකිණීම** | **මෙ.ටොන්. දහස්** | 1,587 | 1,342 |

මේ අනුව ආර්ථිකයේ අඩාළ වීම අනෙකුත් ප්‍රධාන අංශ හරහා ද පිළිබිඹු වේ. වරාය සේවා සැපයීම ද මෙම නිෂ්පාදන සහ විදේශ වෙළෙඳාම සමඟ ගැටගැසී ඇති තවත් අංශයකි. ඒ සම්බන්ධ තොරතුරු පහත වගු අංක 04 සටහන මඟින් ඉදිරිපත් කෙරේ.

ඉහත දත්ත මත බොහෝ අර්බුද තිබුණු 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ වරාය මෙහෙයුම් වර්ධනය වී නැත. අනෙක් අතට රටෙහි දළ දේශීය නිෂ්පාදනයේ කඩාවැටීම හරහා ද මෙම ආර්ථික අර්බුදය තීව්‍ර 07 පිටුවට

# නිවාස අහිමි වීම් ඉහළ යාම විසින් පෙන්වනු ලබන අර්බුදයේ පැතිකඩ

**කැලිෆෝනියාවේ විශාල ජන පිරිසක් නිවාස මිල ගණන් හා කුලී දරාගත නොහැකි වීම හේතුවෙන් වහළක් අහිමිව වීදිවල ජීවත් වෙමින් සිටින බව එක්සත් ජනපද රජයේ වාර්තාවක් විසින්ම හෙළි කර තිබේ. 2008 කාලයේ එක්සත් ජනපදයේ අර්ථික අර්බුදය පළමු අවස්ථාවේ පුපුරා ගියේ නිවාස වෙළෙඳපොළ බිඳවැටීමෙනි. අනතුරුව එය ඩොමිනෝ ආකාරයෙන් මූල්‍ය වෙළෙඳපොළට බලපෑවේය. ජනතාව කෙතරම් ව්‍යසනයකට ලක් වුවද එක්සත් ජනපද පාලනය මූල්‍ය අධිපතීන් බේරා ගත්තේ මූල්‍ය ක්ෂේත්‍රයට ඩොලර් බිලියන ගණනක සහන පැකේජ (bailout) පොම්ප කරමිනි. එම අර්බුදය මුළුමනින්ම නොවිසඳී ඉදිරියට ඇදෙමින් තිබියදී, නැවතත් ඉහළ නිවාස මිල ගණන් හේතුවෙන් ජනතාව මහමඟට ඇදවැටෙන තත්ත්වයක් එක්සත් ජනපදයෙන් වාර්තා වීම නැවතත් අර්බුදය පොලාපැනීමේ අවදානමක් විය හැකි බවට මත පළ වෙමින් තිබේ.**

එක්සත් ජනපද නිවාස හා නාගරික සංවර්ධන දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද වාර්තාවකට අනුව 2022 වසරට වඩා 2023 ජනවාරි මාසයේ නිවාස අහිමි වූවන්ගේ (homeless people) ප්‍රතිශතය සියයට 5.8කින් ඉහළ ගොස් ඇති අතර, එය සංඛ්‍යාත්මකව 1,81,399ක අගයකි. එක්සත් ජනපදයේ සමස්ත නිවාස නොමැති ජනගහනයෙන් සියයට 28ක් කැලිෆෝනියාවේ ජීවත් වන අතර, එය ඇමෙරිකාවේ ජනපද 50 අතුරින් විශාලතම කොටස නියෝජනය කරයි.

2023 වසරේදී එක්සත් ජනපදයේ නිවාස රහිතභාවය සියයට 12කින් ඉහළ ගොස් ඇත්තේ, 2007න් පසු ඉහළම අගය වාර්තා කරමිනි. ප්‍රමාණයෙන් 1,03,200ක් වන දෙවැනි වැඩිම නිවාස නොමැති ජනගහනය නියෝජනය කරන්නේ නිව්යෝර්ක් ප්‍රාන්තයයි. එය සමස්තයෙන් සියයට 16ක ප්‍රමාණයකි. 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී නිව්යෝර්ක්හි මිනිසුන් 29,022ක සංඛ්‍යාවකට නිවාස අහිමි වී තිබේ. එය සියයට 39.1ක වැඩි වීමක් සටහන් කරයි.

2022 සහ 2023 වසර අතරතුර ප්‍රාන්ත 09ක නිවාස නොමැතිභාවය ඉහළ ගොස් තිබේ. රජයේ වාර්තාව අනාවරණය කරන්නේ නිවාස නොමැතිභාවය ඉහළ නැඟීම කෙරෙහි නිවාස කුලී ඉහළ නැඟීම,



නිවාසවලින් නෙරපීම වැළැක්වීමේ රජයේ සහන කාලය අහෝසි වීම සහ දැරිය හැකි මිලකට නිවාස නොමැති වීම වැනි එකිනෙකට සම්බන්ධිත සාධක කිහිපයක් මෙම තත්ත්වයට බලපා ඇති බවය.

නිවාස අහිමි වීමේ තත්වයට අමතර වශයෙන් සිය හිසට වහළක් අහිමිව (unsheltered) ජීවත් වන වැඩිම ජන ප්‍රජාවක් වාසය කරන්නේද කැලිෆෝනියාවේය. එය නිවාස අහිමි ජනතාවගෙන් සියයට 68ක් පමණ වේ. එක්සත් ජනපදය තුළ නිවසක් අහිමි වීම විස්තර කෙරෙන්නේ සාම්ප්‍රදායිකව නිවාසයක් තුළ කෙනකු ජීවත් නොවන නමුත්, ගෙදරක් පවත්වා ගන්නා බවට සැලැකෙන තත්ත්වයකි. තාවකාලික කඳවුරුවල, තමන්ගේ වාහන තුළ හෝ රාත්‍රියට නිශ්චිත ස්ථානයකට පැමිණ නිඳගන්නා පුද්ගලයන් සහ තමන්ගේ බඩුබාහිරාදිය තබාගෙන වැඩි කාලයක් ගත කරන ස්ථානය ගෙදරක් (home) ලෙස සැලැකේ.

නිවාස නොමැති පුද්ගලයකු සාපේක්ෂව වහළක් අහිමි වූ පුද්ගලයකු ලෙස සැලැකෙන්නේ මිනිස් වාසයට නුසුදුසු ස්ථානයක වාසය කරන අයකු ලෙසය. එය මොටර් රථයක, පදිකවේදිකාවේ හෝ පොදු උද්‍යානයක ජීවත් වීමක් විය හැකිය. කැලිෆෝනියාවේ මෙවැනි තත්ත්වයක සිටින පුද්ගලයන් සමස්ත රටේම සිටින ප්‍රමාණයෙන් සියයට 49ක් නියෝජනය කරයි.

කැලිෆෝනියා සරසවිය විසින් සිදු කරන ලද සමීක්ෂණයක් අනාවරණය කර ඇත්තේ, අධික දරිද්‍රතාව සහ අතැති මුදලට සරිලන කුලියකට නිවාසයක් ලබා ගත නොහැකි වීම මෙම තත්ත්වයට හේතු වී ඇති බවයි. කැලිෆෝනියාවේ වීදිවල ජීවත් වන බොහෝ දෙනකුට නිවාස අහිමි වී ඇත්තේ, නිවාස මිල ගණන් දැරිය නොහැකි වීම නිසාවෙන් බවද එය කියයි.

නිවාස අහිමි වූවන්ගේ සංඛ්‍යාව වේගයෙන් ඉහළ නඟිමින් පවතින්නේ කැලිෆෝනියානු ප්‍රාන්ත පාලනය 2018 - 2021 කාලය තුළ නිවාස රහිතභාවයට මුහුණ දීම සඳහා ඩොලර් බිලියන 10කට ආසන්න මුදලක් වැය කරමින් සිටියදී වීම විශේෂත්වයකි.

මෙම තත්ත්වය එක්සත් ජනපදයට පමණක් සීමා වී නැත. එක්සත් රාජධානියේද නිවාස නොමැතිකම වේගයෙන් ඉහළ ගොස් ඇත. පුණ්‍යායතන ප්‍රකාශ කරන්නේ 2010 වසරේ පැවති තත්ත්වය 2023 වන විට සියයට 74කින් ඉහළ නැඟ ඇති බවය. පසුගිය වසර 15ක කාලය තුළ නිවාස අහිමි වීම් නරක තත්ත්වයකට පත්ව ඇති බවත් කුඩා දරුවන් සහිත පවුල් නිවාස නොමැති වීමෙන් පීඩා විඳින බවත් ප්‍රකාශ වේ. විශේෂයෙන් කොවිඩ් වසංගත සමයේ සියලු දෙනා නිවහනක් තුළ සිටිය යුතු බවට වූ රාජ්‍ය වැඩසටහන් හේතුවෙන් 37,000කට වැඩි පිරිසකට නිවාස රැකවරණය ලැබී තිබූ නමුත් වසංගත සමයෙන් පසුව සුබසාධන කප්පාදු වීමත් ආර්ථික දුෂ්කරතා ඉහළ යාමත් සමග මෙම පිරිසට සිදුව ඇත්තේ නැවතත් වීදිවලට පය තැබීමටය.

මේ සියලු තත්ත්වයන් ප්‍රකට කරන්නේ එක්සත් ජනපදය, එක්සත් රාජධානිය වැනි වර්ධිත තැනකදී පවා ධනවාදයට තමන්ගේ අර්බුදයට තාවකාලික විසඳුම් පවා සෙවිය හැකි සීමාව ඉක්මවා ඇති බවය.

# ආර්ථික දේහය වෙළා ගන්නා වැට්

**වටිනාකම් එකතු කිරීම මත පනවනු ලබන බද්ද- වැට්, (value-added tax-VAT) නම් වේ. එය පොදුවේ සැලැකෙන්නේ භාණ්ඩයක හෝ සේවාවක මිල මත නිෂ්පාදනයේදී, බෙදාහැරීමේදී හෝ පාරිභෝගිකයාට අලෙවි කිරීමේදී යන සෑම අවස්ථාවකදීම අයකරනු ලැබිය හැකි බදු විශේෂයක් ලෙසය. මෙහිලා වැදගත් වන පොදු කරුණක් වන්නේ අවසන් පාරිභෝගිකයා තමන්ගේ භාණ්ඩ හෝ සේවා මත බදු එකතු කරන හා රජයට ගෙවන ව්‍යාපාරයක් වන්නේ නම් එම ආයතනයට තමන් විසින් ගෙවන ලද වැට් බදු ආපසු අයකර ගත හැකි බවට වන අදහසයි. මූලික වශයෙන්ම වක්‍ර බද්දක් වන අතර, එහි බර දරනු ලබන්නේ එය රජයට ගෙවනු ලබන පුද්ගලයා නොව භාණ්ඩය හා සේවාවේ අවසන් පාරිභෝගිකයා වන මහජනතාවය.**

## වැට් ඉතිහාසය

වැට් බද්ද පළමුවරට ලෝකයට හඳුන්වා දෙනු ලැබුවේ 1954දී ප්‍රංශය විසිනි. ශ්‍රී ලංකාවේදී පළමුවරට වැට් බද්ද පනවනු ලැබුවේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව විසින් 2002 වර්ෂයේදීය.

- 2002 අගෝස්තු 01වැනි දින සිට වැට් ක්‍රියාත්මක වූයේ එක් වැට් බදු අනුපාතයක් අනුව නොව 0%, 10%, 20% ලෙස බදු අනුපාත 3ක් යටතේය.
- 2005 වසරේදී එම අනුපාත 05%, 15%, 18% වශයෙන් සංශෝධනය විය.
- අනතුරුව 2006 වසරේදී වැට් බද්ද 20% තනි අගයකට ගෙන එන ලදී.
- 2007දී එය 15% දක්වා වෙනස් විය.
- නැවතත් 2009දී වැට් අගය 12% දක්වා සංශෝධනය විය. එතෙක් භාණ්ඩ හා සේවා මත පමණක් ක්‍රියාත්මක වූ වැට් 2013දී පළමුවරට මහා පරිමාණ තොග හා සිල්ලර වෙළෙඳාම මතද පනවනු ලැබිණි. ඒ අනුව දිනකට රුපියල් ලක්ෂ 28ක පිරිවැටුමක් වාර්තා කරන වෙළෙඳ ආයතන මත 12%ක වැට් බදු පැනවිණි.
- 2014දී වෙළෙඳ ආයතනයක දෛනික පිරිවැටුම රුපියල් ලක්ෂ 14ක් දක්වා අඩු කරමින් බදු දැළ පුළුල් කරන ලදී.
- නැවතත් 2016දී දිනකට රු. 1,38,000ක පිරිවැටුමක් ඇති තොග හා සිල්ලර ආයතන මත වැට් පනවනු ලැබූ අතර, එය 15%ක අගයක් විය.
- 2020 වර්ෂයේ සිට වැට් බදු ප්‍රතිශතය 8%ට අඩු කෙරිණි.
- 2022 වර්ෂයේ ජුනි 01 දින සිට 12% දක්වා වැඩි කරන ලදී.
- 2022 සැප්තැම්බර් 01වැනි දින සිට 15% දක්වා වැඩි කරන ලදී.

2024 බදු සංශෝධන




### • බදු නිදහස කප්පාදු කිරීම

විවිධ බදු අනුපාත වෙනස් වෙමින්ද, තොග හා සිල්ලර වෙළෙඳාමේදී පිරිවැටුමේ ප්‍රමාණ වෙනස් වෙමින්ද පැමිණි නමුත්, වැට් බද්ද නොපනවා ඉතිරි කර ගන්නා ලද භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් තිබිණි. භාණ්ඩ හා සේවා 138ක පමණ ප්‍රමාණයක් මෙම කාණ්ඩයට ඇතුළත් විය. එයට මූලික වශයෙන් ඇතුළත් වූයේ ජන ජීවිතයේ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන්ය. ඒ මත වැට් බද්ද ක්‍රියාත්මක වීම ජන ජීවිතයට දැඩිව බලපානු ඇති බව ප්‍රකාශ විණි. ජංගම දුරකථන, විදුලි උපකරණ, අධ්‍යාපන උපකරණ, ඛනිජ තෙල්, ගෑස්, කිරිපිටි, පොත්, සඟරා, පුස්තකාල සේවා, පරිගණක, පුනර්ජනීය විදුලි යන්ත්‍රසූත්‍ර, දේශීය කිරි, ඇස් කණ්ණාඩි හා රාමු වැනි භාණ්ඩ මත වැට් පැනවෙයි.

නමුත්, නව සංශෝධන මගින් එම කාණ්ඩයෙන් භාණ්ඩ හා සේවා ක්ෂේත්‍ර 97ක ප්‍රමාණයක් මත 18%ක වැට් අගය ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට වැට් බදු නොපනවා ඇති භාණ්ඩ හා සේවා ඇත්තේ 33ක් පමණි. තිරිඟු පිටි, ළදරු කිරිපිටි, ඖෂධ, බොරතෙල්, ආබාධිතයන් සඳහා වන උපකරණ, බීජ, රෙදිපිළි කර්මාන්තය සඳහා නූල් හා ඩයි, සහල්, පාන් වැනි භාණ්ඩ හා සැපයුම්ද, අධ්‍යාපන සේවා, මගී ප්‍රවාහණ සේවා, මූල්‍ය සේවා, තානාපති සේවා සඳහා සපයන භාණ්ඩ හා සේවා වැනි කාණ්ඩ ඒ අතර වේ.

### • බදු අනුපාතය ඉහළ දැමීම

2022 සැප්තැම්බර් 01වැනි දින සිට මෙතෙක් ක්‍රියාත්මක වැට් බදු අනුපාතය වූයේ 15%කි. එය නව සංශෝධනය සමඟ 2024 ජනවාරි 01 දින සිට 18%ක් දක්වා ඉහළ දමනු ලැබිණි. මූල්‍ය අරමුදල සමඟ වන ආණ්ඩුවේ එකඟතා අනුව රාජ්‍ය ආදායම් ඉහළ නංවා ගැනීම මෙම අනුපාත ඉහළ දැමීමේ අරමුණ බව ප්‍රකාශ විය. මෙම බදු ඉහළ දැමීම මගින් 2024 වසරේදී 2023 වසරට වඩා 105% ගුණයක වැඩිපුර වැට් බදු ප්‍රමාණයක් (රු. බිලියන 1,400ක්) එකතු කර ගැනීමට ආණ්ඩුව බලපොරොත්තු වේ.

### • පිරිවැටුම් බදු සීමාව පහළ දැමීම

නව වැට් සංශෝධන සමඟ කරන ලද තවත් සංශෝධනයක් වූයේ බදු සඳහා ලියාපදිංචි විය යුතු තොග හා සිල්ලර වෙළෙඳාමට අදාළ වාර්ෂික පිරිවැටුමේ සීමාව එතෙක් පැවැති රුපියල් මිලියන 80ක අගයේ සිට රුපියල් මිලියන 60ක් දක්වා අඩු කිරීමය. ඒ අනුව මාසයකට රුපියල් ලක්ෂ 50ක පිරිවැටුමක් ඇති ඕනෑම ආයතනයකට තමන්ගේ පාරිභෝගිකයන්ගෙන් වැට් එකතු කර දීමට සිදුවනු ඇත. මාසයකට ලක්ෂ 50ක පිරිවැටුම යනු දිනකට රු. 1,66,667ක ප්‍රමාණයකි. (මෙය ලාභය නොවේ.) ඒ අනුව කුඩා සිල්ලර වෙළෙඳසල් නොවන බොහෝ වෙළෙඳ සල් මෙම වැට් ලියාපදිංචි කාණ්ඩයට ඉක්මනින්ම ඇතුළත් කෙරෙනු ඇත.


## කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම

ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල ලෙස දැනට හැකිළී ඇති ආර්ථිකයට නව වැට් විසින් ඇති කරනු ඇත්තේ අහිතකර තත්ත්වයකි. බදු ඉහළයාම 15%-18%ක් වීම නිසා සහ අලුතින් 18% බදු කාණ්ඩයට ඇතුළත් වීම නිසා කෙටිකාලීනව නිසැක ලෙසම මිල ඉහළ යාම් සිදුවේ. ලිට්‍රෝ ගෑස් රුපියල් 685කින්ද, ලාෆ් 07 පිටුවට

# මානව පරිණාමය පිළිබඳ නූතන



## හෝමෝ අර්ගාස්ටර් (Homo Ergaster)



හෝමෝ අර්ගාස්ටර් පොසිල ඇසුරින් නිර්මිත රුවක්

බ්‍රිතාන්‍ය - ඔස්ට්‍රේලියානු ජාතික විද්‍යාඥයකුවූ කොලින් ගෲව්ස් සහ චෙක් ජාතික විද්‍යාඥයකුවූ ව්රැටිස්ලෝව් මාසැක් විසින් 1975දී මිහිමතින් වඳවී ගිය තවත් එක් මානව විශේෂයක් ලෙස හෝමෝ අර්ගාස්ටර් හඳුන්වා දෙන ලදී. එහෙත්, ග්‍රීක් භාෂාවෙන් 'වැඩකරන මිනිසා' යන අදහස සහිතව නම් තබා ඇති හෝමෝ අර්ගාස්ටර් යනු වෙනත් මානව විශේෂයක් නොව හෝමෝ ඉරෙක්ටස්ම යැයි අදටත් සමහර විද්‍යාඥයන්ගේ අදහසයි. එම නිසා මෙම මානව විශේෂය හෝමෝ ඉරෙක්ටස් අර්ගාස්ටර් ලෙස හෝ අප්‍රිකානු හෝමෝ ඉරෙක්ටස් ලෙස හැඳින්වීමටද සමහර විද්‍යාඥයෝ කටයුතු කර ඇත. ආසියාවේ සහ අප්‍රිකාවේ වාසය කළ හෝමෝ ඉරෙක්ටස් මානවයන්ගේ ශරීර ස්වභාවයන් මඳ වෙනසක් සහිත වූ බවත්, හෝමෝ අර්ගාස්ටර් ලෙස නම් කරන්නේ එම අප්‍රිකානු හෝමෝ ඉරෙක්ටස් විශේෂය බවත් තවත් සමහර විද්‍යාඥයන්ගේ මතයයි. එහෙයින්, හෝමෝ අර්ගාස්ටර් සම්බන්ධ සෑම කරුණකදීම මෙම විවාදාත්මක තත්ත්වය පැනනඟී. (පසුගිය කලාපයේදී හෝමෝ ඉරෙක්ටස් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ 'ටුර්කානා බෝයි' (TURKANA BOY), ලැටොලි පා සලකුණු ආදියද අයත් වන්නේ හෝමෝ අර්ගාස්ටර් විශේෂයට යැයි සමහර විද්‍යාඥයෝ තර්ක කරති. )

හෝමෝ හැබිලිස් බිහිවූයේ නැගෙනහිර අප්‍රිකානු කලාපයේ බව බොහෝ විද්‍යාඥයන්ගේ අදහසයි. එමෙන්ම එය බොහෝවිට හෝමෝ හැබිලිස් මානවයන්ගෙන් වෙන්වූ කොටසක් පරිණාමය වීමේ ප්‍රතිඵලයක් විය හැකි බව බහුතර පිළිගැනීමයි. දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් ආසන්නයේ ඩ්‍රිමොලන් නම් කැණීම් භූමියෙන් 2015 වර්ෂයේදී සොයාගත් වසර මිලියන 2.04 - 1.95ක් පමණ පැරැණි හිස්කබල, හෝමෝ අර්ගාස්ටර් ලෙස වර්ග කර ඇති පැරැණිතම පොසිලය වෙයි. (එහෙත්, මෙම හිස්කබලද හෝමෝ ඉරෙක්ටස් විශේෂයට අයත් බවට සමහර විද්‍යාඥයන් තර්ක කරන අතර, මෙතෙක් අවසන් මතයකට එළැඹ නැත.) එලෙස මෙතෙක් වර්ගීකරණය කර ඇති පොසිල සාක්ෂි අනුව අදින් වසර මිලියන 2ත් වසර ලක්ෂ 8ත් අතර කාලය තුළ හෝමෝ අර්ගාස්ටර් මිහිමත ජීවත්වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

හෝමෝ අර්ගාස්ටර් යනු ඉරෙක්ටස් නොව වෙනම මානව විශේෂයක් යැයි සලකන විද්‍යාඥයන්ට අනුව සහ ඔවුන් ඉදිරිපත් කරන සාක්ෂි අනුව හෝමෝ ඉරෙක්ටස්ට ප්‍රථම හෝමෝ අර්ගාස්ටර් පෘථිවිය මත බිහිව ඇත. එම මතවලට අනුව හෝමෝ ඉරෙක්ටස් මෙන්ම හෝමෝ හෙයිල්ඩර්බජෙන්සිස්




හෝමෝ අර්ගාස්ටර් හිස් කබලක්

සහ හෝමෝ නියැන්ඩර්තාලෙන්සිස් යන මානව වර්ග බිහිවන්නට ඇත්තේ හෝමෝ අර්ගාස්ටර් පරිණාමය වීමේ ප්‍රතිඵලයක් ලෙසටය. හෝමෝ අර්ගාස්ටර් යනු සොබාදහමේ අභියෝග සමඟ පොරබැදිය හැකි මට්ටමේ මානවයකු වූ නිසාත්, මේ නිසාම ජනගහනය වැඩිවී නව භූමි ප්‍රදේශ අවශ්‍ය වූ නිසාත්, එසේ නව භූමි ප්‍රදේශවලට හැඩගැසීමට ඔවුනට හැකියාව තිබූ නිසාත්




හෝමෝ අර්ගාස්ටර් භාවිතා කළ ගල් ආයුධ

හෝමෝ අර්ගාස්ටර් අප්‍රිකානු භූමියෙන් පිටවන්නට ඇති බවත්, එමෙන්ම අර්ගාස්ටර් හරහා වෙන වෙනම පරිණාමීය මාවත් ලෙස ඉරෙක්ටස් සහ අනෙකුත් මානව විශේෂ පරිණාමය වන්නට ඇති බවත් සමහර විද්‍යාඥයෝ පවසති.




ඔස්ත්‍රෙලෝපිතකස් ආදී විශේෂයන්ගේ මෙන් කකුල්වලට සාපේක්ෂව දිගු අත් වෙනුවට සාපේක්ෂව කෙටි අත් හෝමෝ අර්ගාස්ටර් සතුවිය. එමෙන්ම පූර්ව වානර විශේෂයන්ගේ මෙන් විශාල පපුවක් සහ සිහින් උදර ප්‍රදේශයක් වෙනුවට සමාන්තර පළලක් සහිත පපුවක් සහ උදරයක් ඔවුහු සතු වූහ. පූර්ව වානර සහ මානව විශේෂයන්ට සාපේක්ෂව වැඩි උසකින් හෝමෝ අර්ගාස්ටර් යුක්තවූ අතර, වැඩුණු අර්ගාස්ටර් මානවයකු අඩි 5 - 6ක් පමණ උස් වන්නට ඇතැයි සැලැකේ. එය සාමාන්‍යයෙන්



හෝමෝ අර්ගාස්ටර් මානවයින්ගේ ජීවන විලාසයන් දැක්වෙන සිතුවමක්

ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ට සාපේක්ෂව දෙගුණයක පමණ උසකි. එසේම ඔවුන්ගේ ස්කන්ධයද පෙර විශේෂයන්ට සාපේක්ෂව වැඩි විය. වැඩුණු අර්ගාස්ටර් මානවයකුගේ බර කිලෝග්‍රෑම් 52 - 63ක් පමණ වන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඔස්ත්‍රෙලෝපිතකස්, පැරැන්ත්‍රොපස්, හෝමෝ හැබිලිස්, හෝමෝ රුඩොල්ෆෙන්සිස් ආදී විශේෂ මෙන් නොව පිරිමි සහ ගැහැනු මානවයන් අතර පැවැති ශරීර ප්‍රමාණයන්ගේ වෙනස්කම් අවම විය.

පූර්ව වානර සහ මානව විශේෂ ජීවත්වූයේ මුහුදු මට්ටමට අඩි 1,000කට වඩා උස් ප්‍රදේශවල වුවද, සාපේක්ෂව පහත්බිම්වල ජීවත්විය හැකි ආකාරයට මෙම මානව විශේෂය හැඩගැසී ඇත. එම නිසා වඩා උණුසුම් භූමි ප්‍රදේශද අර්ගාස්ටර් තම වාසය සඳහා තෝරාගෙන තිබූ අතර, ක්‍රමානුකූලව සමේ රෝම අඩු මානවයන්ට පැවැත්මට ඒමේ

# ා ගවේෂණ

**07 වන කොටස** **පසුගිය කලාපය හා සම්බන්ධයි**




**හෝමෝ ජෝජිකස් පොසිල ප්‍රථම වරට හමුවූ ස්ථානය**



හැකියාව උදාවිය. මෙම මානව විශේෂයට අයත් මානවයකුගේ කපාල ධාරිතාව ඝන සෙ.මී. 600 - 910ක් පමණ වන්නට ඇතැයි විශ්වාස කෙරේ. එනම්, දළ වශයෙන් වත්මන් මානවයාගේ කපාල ධාරිතාවෙන් 2/3ක් හෝ ඊට අඩු විශාලත්වයකි. පිටතට නෙරා ආ ඇහිබැමක් සහ ඊට පිටුපසින් පැතලි, වත්මන් මානවයාට සාපේක්ෂව තිරස් නළලක් ඔවුන් සතු විය. හිස්කබල තුළ මොළයට අඩු ඉඩ ප්‍රමාණයක් ලැබීමට හේතුව එයයි. කෙසේ වුවද, අර්ගාස්ටර් දරුවකු බිහිවන විට සාමාන්‍ය වැඩිහිටියකුගේ මොළයට සාපේක්ෂව 30-50%ත් අතර ප්‍රමාණයකින් මොළය වර්ධනය වී තිබෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. එලෙස පූර්ව විශේෂයන්ගේ මෙන් කුඩා කාලයකින් මොළය වර්ධනය වීම නිසා දෙමාපිය රැකවරණය සහිතව ගත කළ යුතු කාලය අවම විය. එසේම පූර්ව විශේෂයන්ට සාපේක්ෂව පිටතට නෙරා ආ නාසයක් ඉරෙක්ටස්ගේ මෙන්ම අර්ගාස්ටර් මානවයන්ටද තිබූ අතර, වියළි, උණුසුම් පරිසරවල ජීවත්වීමට එයද පහසුවක් විය.

සාපේක්ෂව දියුණු ආයුධ නිෂ්පාදනය කිරීමේ හැකියාවක් මෙම මානව විශේෂය සතුවිය. තියුණු, දෙපසම මුවහත්, සියුම් ආයුධ ගල්, ලී දඬු ආදියෙන් මෙන්ම සත්ව අස්ථි මගින් පවා නිපදවා තිබිණි. වසර ලක්ෂ 17 - 15ක පමණ පටන් ගින්දර භාවිත කිරීමට අර්ගාස්ටර් මානවයාද පුරුදු වන්නට ඇති බවට විශ්වාස කරන නමුත්, ගින්දර පාලනය කිරීමේ හැකියාවක් ඔවුන් සතු වූවාද යන්න තවමත් ගැටලුවක්ව පවතී. මෙම මානවයන් ලබා ගන්නා ආහාර අතර මස් ප්‍රමුඛ විය. අල වර්ග, ඇට වර්ග, කොළ වර්ග, පැළෑටි වර්ග, කෘමි වර්ග ද ආහාර ලෙස භාවිත කරන්නට ඇති බවට සාක්ෂි ලැබී ඇත.

පූර්ව මානව විශේෂයන්ට සාපේක්ෂව වේගයෙන් දිව යාමේ හැකියාවක් අර්ගාස්ටර්ට තිබූ අතර, දඩයමේ යාමේදී මෙන්ම සතුරු උපද්‍රවවලින් ආරාක්ෂා වීමේදී එය ඔවුනට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නට ඇත. කණ්ඩායම් ලෙස එක්ව දඩයමේ යාමත්, දඩයමේ යාමේදී පිරිමි මානවයන්ට මූලිකත්වය දීමත් අර්ගාස්ටර් අවධියේ සිදුවී ඇත. අසනීප වූවන් සහ තුවාලකරුවන් රැකබලා ගැනීමට මෙම මානවයා පුරුදු වී සිටියද, මියගිය පසු වළදැමීම් හෝ නොකර සිරුරු අත්හැර දමා ඇති බවට විද්‍යාඥයෝ විශ්වාස කරති. හඬ පාලනය කිරීමට යම් හැකියාවක් අර්ගාස්ටර්ට තිබුණද, ඔවුන් භාෂාවක් භාවිත කළ බවට පිළිගත හැකි සාක්ෂි මෙතෙක් හමුව නැත.

අර්ගාස්ටර් මිහිමත වාසය කළ කාලය තුළ ඔස්ත්‍රෙලෝපිතකස් සෙඩීබා, පැරූන්ත්‍රොපස් බොයිසෙයි, පැරූන්ත්‍රොපස් රෝබස්ටස්, හෝමෝ හැබිලිස්, හෝමෝ රුඩොල්ෆෙන්සිස්, හෝමෝ ඉරෙක්ටස් ආදී විශේෂද සමාන්තර කාලවල මිහිමත වාසය කර ඇත. හෝමෝ ඉරෙක්ටස් ආසියානු කලාපයේ තවදුරටත් එලෙසම පවතිද්දී, අප්‍රිකානු භූමියේ සිටි හෝමෝ අර්ගාස්ටර් හරහා වත්මන් මිනිසා පරිණාමය වූයේ යැයි සමහර විද්‍යාඥයෝ විශ්වාස කරති.


## හෝමෝ ජෝජිකස් (Homo Georgicus)

හෝමෝ හැබිලිස් සහ හෝමෝ ඉරෙක්ටස් අතර අතරමැදි ලක්ෂණ පෙන්නුම් කරන මානව විශේෂයක් ලෙස හෝමෝ ජෝර්ජිකස් හඳුනාගෙන ඇත. 1999දී සහ 2001දී හමුවූ, ජෝර්ජියාවේ ද්මානිසි නම් ප්‍රදේශයෙන් සොයාගත් මානව පොසිල පදනම් කරගනිමින් තවත් පූර්ව මානව විශේෂයක් ලෙස 2002 වසරේදී හෝමෝ ජෝර්ජිකස් නම් කර ඇත. මෙම පොසිල



**හෝමෝ ජෝජිකස් හිස් කබලක්**

සොයාගත් මුල් අවස්ථාවේදී ඒවා හෝමෝ අර්ගාස්ටර් විශේෂයට අයත් ලෙස නම් කළද, පසුව ඒවායේ ප්‍රමාණවල සහ හැඩවල වෙනස්කම් මත නව මානව විශේෂයක් නම් කිරීමට හේතුවිය. තවත් සමහර විද්‍යාඥයන් පවසන්නේ හෝමෝ අර්ගාස්ටර් සහ හෝමෝ ඉරෙක්ටස් යන විශේෂ දෙකම බිහිව ඇත්තේ හෝමෝ ජෝජිකස් පරිණාමය වීම හරහා බවයි.



**හෝමෝ ජෝජිකස් හිස් කබලක් ආශ්‍රයෙන් නිර්මිත රුවක්**

මෙලෙස සොයාගත් එක් හිස්කබලක් ඝන සෙ.මී. 600ක කපාල ධාරිතාවෙන් යුක්ත වන අතර, එය අප්‍රිකානු මහාද්වීපයෙන් පරිබාහිරව සොයාගත් කුඩාම කපාල ධාරිතාවක් සහිත මානව හිස්කබලවලින් එකකි. (හෝමෝ ෆ්ලෝරැන්සිස් විශේෂය සොයාගන්නා තෙක් අප්‍රිකානු කලාපයෙන් පිටතදී සොයාගත් කුඩාම මානව හිස් කබල ලෙස සැලැකුණේ එයයි.) එය අදට වසර මිලියන 1.77ක් පැරණි බවට ගණන් බලා තිබේ. එසේම පූර්ව වානර විශේෂවල මෙන් ගැහැනු, පිරිමි විශේෂවල ශරීර ප්‍රමාණ අතර කැපීපෙනෙන මට්ටමේ අසමානතාවන් පැවැති බවට 07 පිටුවට




# දකුණු අප්‍රිකාව සහ බටහිර ප්‍රජාතන්ත්‍රවාදය

පසුගිය ජනවාරි 11 වැනි දින දකුණු අප්‍රිකාව විසින් ඊශ්‍රායලය ගාසා තීරයේ දියත් කර තිබෙන මිලිටරි මෙහෙයුම වර්ග සංහාරයක් බව චෝදනා කරමින් ජාත්‍යන්තර යුක්ති අධිකරණයේ (ICJ) පැවරූ නඩුවට අදාළව මූලික අදහස් දැක්වීම ආරම්භ කරනු ලැබිණි. නමුත්, මෙය පදනම් විරහිත නඩුවක් බව ඊශ්‍රායලයට පූර්ණ පක්ෂපාතීත්වය සහ අනුග්‍රාහකත්වය දක්වන ඇමෙරිකාව විසින් චෝදනා කරනු ලබන අතර, ඔවුන් විසින් අවස්ථා දෙකකදීම සිය නිෂේධ බලය භාවිත කරමින්, ගාසාහි සටන් විරාමයක් සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත්වූ යෝජනාද පරාජයට පත් කරනු ලැබිණි. කෙසේ නමුත්, මෙම නඩුව සුවිශේෂී වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් සහ ශිෂ්ටත්වය පිළිබඳව උදාහරණ සපයන බටහිර රටවලට ගාසාහි සිදුවන සංහාරය වර්ග සංහාරයක් නොවන බවට තමන්ගේ න්‍යායන් තුළින් පිටතට පැමිණ ලෝකය ඉදිරියේ ප්‍රත්‍යක්ෂ කිරීමට සිදු වෙන නිසාය. මෙම නඩුව ඉතාමත් පුළුල් පරාසයක් ආවරණය වන පරිදි ඊශ්‍රායලය වෙතින් ඉදිරිපත් කිරීමට නියමිත සියලුම තර්කවලට ප්‍රතිඋත්තර සැපයිය හැකි ලෙස කරුණු අඩංගු කරමින් සකසා ඇති බව පැවසේ. මේ වන විට මුළුමහත් ලෝකයේම අවධානය මේ වෙත යොමුවී තිබෙන අතර, ජාත්‍යන්තර නීතිය තුළ දරුණුම අපරාධයක් ලෙස සැලකෙන වර්ග සංහාර චෝදනාව කෙසේ යුක්ති අධිකරණය තුළ අර්ථනිරූපණය වන්නේ දැයි ලෝකයම බලා සිටී.

## දෙවන ලෝක යුද්ධයෙන් පසුව සිදු වන විශාලතම NATO අභ්‍යාසය

නේටෝ (NATO) සංවිධානය විසින් දෙවන ලෝක යුද්ධයෙන් පසුව සිදු කරනු ලබන විශාලතම අභ්‍යාසය සිදුකිරීමට මේ වන විට සූදානම් වෙමින් පවතී. නේටෝහි ප්‍රධාන අණදෙන නිලධාරී ක්‍රිස් කැවොලි (Chris Cavoli) සඳහන් කරනු ලබන ආකාරයට ගුවන් යානා ප්‍රහාරක් නෞකා 50ක්, ප්‍රහාරක ජෙට් යානා, ඩ්‍රෝන යානා සහ හෙලිකොප්ටර් 80කට වැඩි ප්‍රමාණයක්, යුද ටැංකි 133කින් සමන්විත සන්නද්ධ රථ 1,100ක් සහ 90,000ක හට පිරිසක් සමඟ මැයි මාසය තෙක් මෙම යුද අභ්‍යාස කිරීමට නියමිත බවය. ජෙනරාල් කැවොලි තවදුරටත් සඳහන් කරන්නේ නේටෝහි එකමුතුකම, එකිනෙකා ආරක්ෂා කිරීමට ඇති අධිෂ්ඨානය සහ ශක්තිය මෙම අභ්‍යාස මඟින් සංකේතවත් කෙරෙන බවයි.

මෙම අභ්‍යාස කිරීමට ඔවුන් තෝරාගෙන ඇත්තේ, රුසියානු ප්‍රහාරවලට ලක්වීමේ අවදානමක් පවතින බෝල්ටික් රාජ්‍ය සහ ජර්මනිය වේ. මේ හා සමාන පරිමාණයේ අභ්‍යාසයක් නේටෝව අවසන් වරට සිදු කර ඇත්තේ, 1988 වර්ෂයේ වන අතර, එය රිෆෝජර් (Reforger) අභ්‍යාසය නමින් හඳුන්වනු ලැබීය. එය 1,25,000ක යුද සෙබළුන්ගෙන් යුක්ත වූ අතර, ඊට අමතරව 2018 වර්ෂයේදී 50,000ක පිරිසකගේ සහභාගීත්වයෙන් තවත් අභ්‍යාසයක් සිදු කර ඇත.

## හුතී කැරැලිකරුවන් සහ රතු මුහුදේ ඇවිළෙන ගිනි

යුරෝපය, ආසියාව, අප්‍රිකාව සහ මැදපෙරදිග නෞකා යාත්‍රා කෙරෙන ලෝකයේ ප්‍රධානම නෞකා මාර්ගයක් වන රතු මුහුද තුළ ඊශ්‍රායලයට අයත් සහ ඊශ්‍රායලයට සම්බන්ධ නැව්වලට යේමන කැරැලි කණ්ඩායමක් වන හුතී (Houthi) කැරැලිකරුවන් පහර දීම ආරම්භ කර තිබෙනවා. ඊශ්‍රායලය විසින් ගාසා තීරය ආක්‍රමණය කිරීමට එරෙහිව සහ පලස්තීනයේ හමාස් සංවිධානයට සහාය දැක්වීමක් ලෙස මෙම ප්‍රහාර සිදු කරන බව හුතී කැරැලිකරුවන් නිල වශයෙන් මේ වන විට ප්‍රකාශ කර තිබෙනවා. එමෙන්ම මෙම ක්‍රියා ඊශ්‍රායලය විසින් පලස්තීනය අල්ලා ගැනීමට එරෙහිවත්, ඊශ්‍රායලය විසින් අන්තර්ජාතික නීතිය කඩ කරමින් ගාසා තීරයේ සිදු කරන මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට එරෙහිව සහ යේමනයේ ස්වාධීනත්වය සහ භෞමික අඛණ්ඩතාව විදෙස් බලවේගවලින් ආරක්ෂා කර ගැනීමටත් ගනු ලබන ඒවා බව ඔවුන් ප්‍රකාශ කර ඇත.

දිගින්දිගටම එල්ල වන ප්‍රහාර හමුවේ ඇමෙරිකා එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය එක්ව හුතී කැරැලිකරුවන්ගේ ඉලක්ක වෙතද ප්‍රහාර එල්ල කිරීමට පටන් ගෙන ඇත. 2021 වසරේදී ලෝක ත්‍රස්තවාදී ලැයිස්තුවෙන් හුතී කැරැලිකරුවන් ඉවත් කර තිබූ අතර, රතු මුහුදේ ප්‍රහාර හේතුවෙන් හුතී කැරැලිකරුවන් ත්‍රස්තවාදීන් ලෙස යළි නම් කිරීමට නියමිතයි.

# ජර්මනියේ පුපුරා යන ගොවි සටන

ජර්මනියේ 'ට්‍රැෆික් ලයිට්' (Traffic Light) සභාග ආණ්ඩුව විසින් ගොවීන්ට කෘෂිකාර්මික කටයුතු සඳහා දෙනු ලබන ඩීසල් සඳහා වන බදු සහන කපාහැරීමත්, ගොවි වාහන සඳහා වාහන බදුවලින් නිදහස් කිරීම කපාහැරීමත් දෙසැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කිරීමත් සමඟ සභාග ආණ්ඩුවේ තීරණවලට එරෙහිව ජර්මනිය පුරා ගොවීහු සහ වෘත්තීය සමිති ඒකාබද්ධව විරෝධතාවලට අවතීර්ණ වී සිටිති. ජර්මානු ගොවි සංගමය (DBV) සහ 'Agriculture Connects Germany' (LSV) වැනි සංවිධාන විසින් ආරම්භ කරන ලද මෙම විරෝධතාවලට ට්‍රැක්ටර් රථ රැළි සහ මාර්ග බාධකද ඇතුළත් කරගෙන තිබේ. වාර්තාවලට අනුව, මෙම දැවැන්ත විරෝධතා හමුවේ ජනවාරි 4දා රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවේ කෘෂිකාර්මික හා වන වගා වාහන සඳහා මෝටර් වාහන බදු නිදහස් කිරීම දිගටම කරගෙන යාමට තීරණය කර ඇති බවත්, 2024 සිට 2026 දක්වා කෘෂිකාර්මික ඩීසල් සඳහා දෙනු ලබන සහනාධාර පියවරෙන් පියවර අඩු කිරීමටත්ය. නමුත්, ගොවීන්ගේ වෘත්තීය සමිති මින් සෑහීමකට පත් නොවූ අතර, ජනවාරි 8දා සිට සම්පූර්ණ කප්පාදුව ආපසු හරවන තෙක් ඔවුන්ගේ උද්ඝෝෂණ උත්සන්න කිරීමට තීරණය කළහ.ජර්මානු ගොවි සංගමයේ (DBV) සභාපති ජොආකිම් රක්වීඩ් (Joachim Rukwied) ප්‍රකාශ කළේ ආණ්ඩුවේ සහතික ප්‍රමාණවත් නොවන බවත්, 'ට්‍රැෆික් ලයිට්' (Traffic Light) සන්ධානය විසින් අපේක්ෂා කරන ලද කප්පාදුව සඳහාවූ යෝජනා දෙකම සම්පූර්ණයෙන්ම මේසයෙන් ඉවත් කිරීමට සිදුවනු ඇති බවත්ය.

පවතින ගොවීන්ගේ දැඩි විරෝධතාවලින් පසු ගොවීන් සඳහා වන සහනාධාර සමහරක් එලෙසම තබා ගනිමින් සමුද්‍ර ආරක්ෂණය සහ ධීවර ආධාර කප්පාදු කිරීමට සභාග ආණ්ඩුව සැලසුම් කරමින් සිටී. වාමාංශික පාර්ලිමේන්තු මන්ත්‍රිනි, සාරා වාගෙන්කනෙක් (Sahra Wagenknecht) මෙම කප්පාදුව හෙළාදකිමින් පැවසුවේ යුක්රේනය සඳහා අවශ්‍ය 07 පිටුවට

## තව දුරටත් කඩාවැටෙන ආර්ථිකය.......

01 - පිටුවෙන්

| වරාය සේවා සැපයීම (වගු අංක - 04) | | | | |
|---|---|---|---|---|
| සේවාව | ඒකක | 2022 | 2023 | වෙනස % |
| කන්ටේනර් මෙහෙයුම් | සමානුපාතික ඒකක | 6,305,736 | 6,308,153 | 0.04% |
| භාණ්ඩ හැසිරවීම් | මෙට්‍රික් ටොන් | 92,951,252 | 93,641,972 | 1.10% |

| දළ දේශීය නිෂ්පාදනය (ස්ථාවර මිලට) - රුපියල් බිලියන (වගු අංක - 05) | | | |
|---|---|---|---|
| කාර්තුව | 2022 | 2023 | ආර්ථික වර්ධනය |
| පළමු කාර්තුව | 3,331 | 2,917 | -3.1 |
| දෙවන කාර්තුව | 3,519 | 3,114 | -11.5 |
| තුන්වන කාර්තුව | 2,900 | 2,946 | +1.6 |
| ජනවාරි - සැප් දක්වා GDP | 9,750 | 8,977 | -4.33 |

කර තිබේ.

ඉහත 05 වගුවේ දත්තවලට අනුව දළ දේශීය නිෂ්පාදනය පසුගිය වසරට සාපේක්ෂව ඉතා බරපතළ ලෙස පසුබෑමකට ලක්ව තිබේ. එය මාස නවයකට පමණක් ඩොලර් බිලියන 773ක අඩුවීමකි. ඒ අනුව මුල මාස නවයේ පමණක් ආර්ථික වර්ධන වේගය ඍණ 4.33කි. මෙම ඍණ වර්ධනය ඊළඟ කාර්තුවේ අඩු වේ යැයි පුරෝකථනය කළ නොහැකිය. ඒ අනුව 2023 වර්ෂයද තව දුරටත් ඍණ ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්නා රටක් බවට ලංකාව පත්වේ.

## මානව පරිණාමය .......

04-05 පිටුවෙන්

විශ්වාස කෙරේ. පසුකාලීනව මෙම විශේෂයට අයත් තවත් පැරණි මානව පොසිල හමුව ඇති අතර, ඒවා අදින් වසර මිලියන 1.8ක් පමණ පැරණිය. එමෙන්ම ඒවායේ ශරීර ලක්ෂණ පූර්ව වානර විශේෂවලට සමීප ආකාරයක් ගනී.

ප්‍රථම වරට, එනම්, හෝමෝ ඉරෙක්ටස්ට වසර ලක්ෂ 8කට පමණ පෙර හෝමෝ ජෝජිකස් විසින් යුරෝපයේ ප්‍රදේශ වාසභූමි ලෙස භාවිත කර ඇති බව මෙතෙක් සොයාගෙන ඇති සාක්ෂි අනුව පෙනීයයි. සමහර විද්‍යාඥයෝ මෙම විශේෂය තවත් හෝමෝ ඉරෙක්ටස් උපවිශේෂයක් ලෙස සඳහන් කරමින්, හෝමෝ ඉරෙක්ටස් ජෝර්ජිකස් ලෙස නම් කර ඇත. එහෙත්, හෝමෝ ඉරෙක්ටස්ගේ කපාල ධාරිතා පරාසයන්ට වඩා බොහෝ සෙයින් අඩු කපාල ධාරිතාවක් සහිත වීම ඇතුළු ශරීර ලක්ෂණවල වෙනස්කම් ජෝජිකස් තවත් වෙනස් මානව විශේෂයක් ලෙස හඳුනා ගැනීමට මඟපාදා ඇත. විශේෂයෙන් බාහු යුගල මෙන්ම විශාල වාර්වක දත් පිහිටීම වඩාත් සමාන වූයේ පූර්ව මානව විශේෂයන්ටය. එහෙත්, කොඳුඇට පෙළ ආදිය ඉරෙක්ටස්, අර්ගාස්ටර් මෙන් විය.

හෝමෝ ජෝජිකස් ගල් ආයුධ නිපදවා භාවිත කළ බවට සාක්ෂි ලැබී ඇත. පැළෑටි වර්ග, ඇට වර්ග, පලතුරු වර්ග, කොළ වර්ග ඔවුන්ගේ ප්‍රධාන ආහාරය විය. ගස්වල ඉහළ අතු අතර නිඳ ගැනීම තවදුරටත් ඔවුන්ගේ පුරුද්ද විය.

තවත් කොටසක් මීලඟ කලාපයෙන්...

## ආර්ථික දේහය .......

03 - පිටුවෙන්

ගෑස් 755කින්ද ඍජුව ඉහළ යන්නේ වැට් කාණ්ඩයට ඇතුළත් වීම අනුවය. දුරකථන ගාස්තුව තුළ වන වන මුළු බදු ප්‍රතිශතය 42.02%ක් වනු ඇති බව ප්‍රකාශ වේ. ජංගම දුරකථන හා උපාංග මිල ගණන් 35%කින් ඉහළ ගියේය. සිමෙන්ති කොට්ටයක මිල රුපියල් 350.00කින් ඉහළ දමා ඇති අතර, ත්‍රිරෝද රථ දෙවැනි කිලෝමීටරයේ අගය රු. 80.00 සිට 100.00 දක්වා වැඩි කර ඇත. පෙට්‍රල් රු. 20.00කින්ද, ඩීසල් රු. 29.00කින්ද මිල ඉහළ දැමිණි. භාණ්ඩ හා සේවා ක්ෂේත්‍රයේ සැබෑ මිල ඉහළ නැඟීම වෙළෙඳපොළ තුළ ප්‍රදර්ශනය වීම සඳහා යම් කාලයක් ගනු ඇත. කෙටිකාලීනව පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවී යාම තුළ භාණ්ඩ හා සේවා ඉල්ලුම අඩු වේ.

දිගුකාලීන ලෙස සැලැකුවහොත්, වෙළෙඳපොළ හැකිළීම කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන කර්මාන්තවලට හා ව්‍යාපාරවලට මාරාන්තික ලෙස බලපෑ හැකිය. ඒවා වසා දැමීමට සිදුවිය හැකිය. තේ වැනි කර්මාන්ත ක්ෂේත්‍රයක් පොහොර ප්‍රශ්නය හමුවේ 23%කින් බිඳවැටී ඇති තත්ත්වයක් තුළ වැට් බදු මඟින් නිෂ්පාදන වියදම ඉහළ යාම තරගකාරීත්වය බිඳවට්ටනු ඇත. අනෙක් අතට අධ්‍යාපන සේවා වැට් බද්දෙන් නිදහස් වුවත්, පොත්පත්, ලිපිද්‍රව්‍ය හා උපකරණ, පුස්තකාල සේවා වැට් බද්දට ඇතුළු වීම නිසා 18%කින් මිල ඉහළ යනු ඇත. එම තත්ත්වය දැනටමත් අධ්‍යාපන වියදම් දරාගත නොහැකි පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන ගමන අවසන් කරනු ඇත්තේය.

විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ පර්යේෂණ අංශ මත අලුතින් වැට් බදු පැනවීම එම අංශවල ගුණාත්මකභාවයට අහිතකර ලෙස බලපායි. ආහාර පරිභෝජන වියදම් ඉහළ යාමේ නිසැක ප්‍රතිඵලය වනු ඇත්තේ, මන්දපෝෂණ මට්ටම් ඉහළ නැඟීමය. පොදුවේ පරිභෝජන වියදම් ඉහළ යාම ජනතාව අතර ඉතුරුම් අඩුවීම රටේ ප්‍රාග්ධන හැකියාව සීමා කරවනු ඇත.

නව වැට් බදු සංශෝධනය මඟින් අමතර රුපියල් බිලියන 378ක් උපයා ගැනීමට රජය අපේක්ෂා කළද, අවසානයේ නැවත වටයකින් ආර්ථිකය හැකිළීමට වැට් බදු නැංවීම හේතු වනු ඇති අතරම, අපේක්ෂිත බදු ඉලක්කවලට ළඟාවීමට අසමත් වනු ඇත. විෂම චක්‍රීයව නැවත වරක් වැට් බදු අනුපාතය ඉහළ නැංවීමට ඉල්ලීම් ඉදිරිපත් වනු ඇත්තේ එවිටය.

## ජර්මනියේ පුපුරා යන ගොවි සටන.....

06 - පිටුවෙන්

උපකරණ සහ ආයුධ සම්බන්ධයෙන් විශාල ලෙස මුදල් යොදවන රජය සාමාන්‍ය පුරවැසියන් හට අවශ්‍ය, අඩු ආදායම්ලාභීන් සහ විශ්‍රාමිකයන්ට අදාළ වන ගෑස්, උණුසුම් ගාස්තු සහ විදුලිය සඳහා විශාල ලෙස මිල ඉහළ දමා පීඩාවට පත් කර ඇති බවයි. ජනවාරි 5දා ජර්මානු කොමියුනිස්ට් පක්ෂයේ (ඩීකේපී) නායක පැට්‍රික් කොබෙලේ විරෝධතාවේ නිරත ගොවීන්ට සහයෝගීතාව ප්‍රකාශ කළේය. 'අන්සෙරී සයිට්' (Unsere Zeit - UZ) පුවත්පතෙහි ඔහුගේ ප්‍රකාශයේ දී ඔහු කියා සිටියේ ආණ්ඩුව අර්බුදයේ බර කම්කරු පන්තිය, කුඩා ව්‍යාපාර, කර්මාන්තකරුවන් සහ ගොවීන් මත පටවන අතරේ, යුද යන්ත්‍ර තවමත් ක්‍රියාත්මක වන අතර, ආයුධ කර්මාන්තය උසස් අන්දමින් සිදු කරගෙන යන බවයි. චාන්සලර් ඕලාෆ් ෂොල්ට්ස් (Olaf Scholz) යටතේ ජර්මනියෙන් ආයුධ අපනයනය 40%කින් වැඩි වී තිබෙන අතර, අපගේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ කම්කරු ව්‍යාපාරයේ විශාල කොටස් පාලක පන්තියේ යුද්ධයට හා අර්බුදකාරී මාවතට ඒකාබද්ධ කිරීමට එරෙහි අරගලය බව කොබෙලේ පැවසීය. "අපට අවශ්‍ය වන්නේ කෝපාවිෂ්ට ගොවීන් පමණක් නොව, යුද්ධයට එරෙහිව ට්‍රැක්ටර් ය" යන්න ඔහු තව දුරටත් ප්‍රකාශ කර ඇත.

# කාන්තා විමුක්තිය ගැන ලෙනින්...

ජීව විද්‍යාවේ සංවර්ධනාත්මක පියවරක් වන ලිංග විභේදනය මානව වර්ගයාටද පොදුවේ අදාළ වේ. මීට අනුරූපව මානව වර්ගයාද ස්ත්‍රීන්, පුරුෂයන් සහ මේ දෙකටම අතරමැදි අවස්ථාවේ පසුවන (සංක්‍රාන්ති ලිංගිකයන්) අය වශයෙන් කොටස් තුනකට මූලික වශයෙන් බෙදිය හැකිය. මින් බහුතර ප්‍රමාණයක් වන්නේ ස්ත්‍රීන් සහ පුරුෂයන් වන අතර, සංක්‍රාන්ති ලිංගිකයන්ගේ ප්‍රමාණය සියයට එකක් පමණ වෙයි (මෙම බෙදීම මීටත් වඩා සංකීර්ණ එකක් බව සැලකිය යුතුය). මේ කිසිවක් අපගේ පෞද්ගලික තේරීමක් නොව සොබාදහම විසින් දෙන ලද දෙයකි. කෙසේ නමුත්, අප ජීවත්වන සමාජය තුළ සමාජ, සංස්කෘතික, ආගමික ආදී ක්ෂේත්‍රවල බලපෑම මත මේ පිළිබඳව ගොඩනගා ඇති මතවාද තවදුරටත් බලවත් භූමිකාවක් ඉටු කරනු ලබයි. මෙම මතවාද සහ ආකල්ප කොතරම් අවිද්‍යාත්මක වුවද, එමඟින් පුරුෂයන්, ස්ත්‍රීන් සහ සෙසු කුමන හෝ ලිංගික ප්‍රවර්ගයක් හා සම්බන්ධව අසමාන ලෙස සැලකීම දක්නට ලැබේ.

සමාජමය වශයෙන් කොතරම් වැදගත් භූමිකාවක් ඉටු කරනු ලැබුවද, ස්ත්‍රිය වෙත බලපානු ලබන සමාජයීය පීඩනයද සැලකිය යුතු මට්ටමක තවදුරටත් ඉතිරිව පවතී. පසුගාමී ධනේශ්වර සංවර්ධනයක් පවතින රටවල පමණක් නොව ආර්ථික වශයෙන් දියුණු යැයි සැලකෙන රටවල පවා මෙම ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳ නොමැත.

මෙම තත්ත්වය නිසාම 'ස්ත්‍රී විමුක්තිය' සම්බන්ධයෙන් විවිධ මතවාද මෙන්ම ඒ මත පදනම්වූ සංවිධානද දක්නට ලැබේ. මාක්ස්වාදය තුළින්ද ස්ත්‍රී විමුක්තිය පිළිබඳ ප්‍රශ්නය ගැඹුරින් සලකා බලා තිබේ. අද ලෝකය පුරා සමරනු ලබන 'ජාත්‍යන්තර කාන්තා දිනය'ද දෙවැනි ජාත්‍යන්තරයේ යෝජනාවක් අනුව නම් වී තිබීම තුළම ඒ බව සනාථ වෙයි. ලංකාවේ වාමාංශික ව්‍යාපාරයක් වශයෙන් අපද ස්ත්‍රිය සහ ස්ත්‍රී විමුක්තිය පිළිබඳ ඇති ජනප්‍රිය සහ අවිද්‍යාත්මක, අධිපති මතවාද වෙනුවට නිවැරදි මාක්ස්වාදී දැක්ම තහවුරු කළ යුතුය. මෙම කෙටි ලිපිය ඒ සඳහා ප්‍රවේශයකි.

කාන්තා විමුක්තිය ගැන ලෙනින් විසින් ලියන ලද ලිපි කිහිපයක් හා නදේෂ්දා කෲප්ස්කායාගේ සහ ක්ලාරා සෙට්කින්ගේ ලිපිද ඇතුළත් **'කාන්තා විමුක්තිය ගැන'**-ලෙනින් නම් කෘතිය තුළ මේ පිළිබඳ මාක්ස්වාදී ස්ථාවරය පැහැදිලි කර තිබේ. පන්ති සමාජයක් තුළ අන් සෑම ප්‍රශ්නයක් මෙන්ම ස්ත්‍රී විමුක්තිය පිළිබඳ ප්‍රශ්නයද පන්ති දේශපාලනයෙන් වියුක්ත නොකොට ඒ තුළ තබා විසැඳිය යුතු බව එම ලිපි මාලාව මඟින් තවදුරටත් පෙන්වා දෙනු ලබයි.

එසේම කාන්තා විමුක්තිය සඳහා පෙරමුණ ගත යුත්තේ, කාන්තාවම බවත් ලෙනින් අවධාරණය කරයි.

**"කම්කරු විමුක්තිය කම්කරුවන් විසින්ම උදා කළ යුතු යැයි අපි කියමු. එසේම හරියටම ඒ ආකාරයෙන්ම වැඩ කරන කාන්තාවගේ විමුක්තිය උදා කරලීම වැඩ කරන කාන්තාවටම භාරවූ කරුණකි."**

(94 වැනි පිටුව.)

එහෙත්, එම සටන පුරුෂ විරෝධී එකක් හෝ විමුක්තිය වෙනුවෙන් සටන් වදින අනෙකුත් සමාජ බලවේගවලින් වියුක්ත වූවක් හෝ නොව සූරාකෑමෙන් තොර නව සමාජයක් වෙනුවෙන් කරන අරගලයේම කොටසක් විය යුතු බවද එමඟින් පෙන්වා දෙනු ලබයි.

කාන්තාව මුහුණදී ඇති සමාජ ගැටලුවේ හරය එංගල්ස්ගේ ඉගැන්වීම්ද පාදක කර ගනිමින්, විග්‍රහ කරන ලෙනින්, කාන්තාව දෙවැනි පන්තියේ පුරවැසියකු හෝ ගෘහමය වහලියක හෝ වූයේ ඇය ඵලදායී සමාජ කාර්යයවලින් වෙන්කර පටු, පෞද්ගලික ක්‍රියාකාරීත්වයකට පමණක් සීමා කිරීම නිසා බවද පෙන්වා දෙයි. එනිසාම ඇයගේ විමුක්තිය නීති මඟින් පමණක් ස්ථාපනය කළ නොහැකිය. ඒ සඳහා ඇය සමාජමය කර්මාන්තයට දායක කරගත යුතු බවත්, දැනට පෞද්ගලික සහ නොවැදගත් ලෙස පවතින ගේ-දොර වැඩකටයුතු සමාජමය කර්මාන්තයක් බවට පත් කළ යුතු බවත් පෙන්වා දෙයි. ඒ පිළිබඳව ලෙනින් මෙසේ පවසයි:

**"කාන්තාවට නිවසේ කිරීමට ඇති වැඩ හේතුකොටගෙන ඇය තවමත් දුෂ්කර තත්ත්වයක පසුවන්නීය. ඇයට සම්පූර්ණ විමුක්තිය ලබා දීමට සහ ඇය පුරුෂයා හා සම තත්ත්වයට ගෙන ඒම ක්‍රියාත්මක කිරීමට ජාතික ආර්ථිකය සමාජවාදීයකරණය කිරීමත්, කාන්තාවන් පොදු ඵලදායී ශ්‍රමයේ නිරත කරවීමත් අවශ්‍ය වේ. එවිට කාන්තාවන් පුරුෂයන්ගේ තත්ත්වයම දරනු ඇත.**

(93 වැනි පිටුව.)

ධනවාදය තුළ කාන්තා විමුක්තිය වැරදි ලෙස අර්ථකථනය කර ඇති බවත්, ඒ තුළ කාන්තා විමුක්තිය ලෙස සුළු ධනේශ්වර වුවමනා පෙරට එන බවත් පෙන්වා දෙන ලෙනින්, කාන්තා විමුක්තියේ නාමයෙන් වන ධනේශ්වර සහ සුළු ධනේශ්වර වුවමනාවන් සහ ක්‍රියාමාර්ග අනුකම්පා විරහිතව විවේචනය කරයි. සමාජයේ වැරදි ලෙස විග්‍රහ කර ඇති ලිංගිකත්වය පිළිබඳ ප්‍රශ්නය කොමියුනිස්ට්වාදී ස්ථාවරයක සිට විග්‍රහ කරයි. ලෙනින් සමඟ කළ සංවාදයක් ඇතුළත් ක්ලාරා සෙට්කින්ගේ වාර්තාව මීට සාක්ෂි දරයි.


**"ෆ්‍රොයිඩ්ගේ න්‍යාය දැන් පිස්සුවක්වී තිබෙනවා. ලිපි, පොත් පිංචවල් සහ සංග්‍රහ යනාදියෙන් ඉදිරිපත් කරනු ලබන න්‍යායන් කෙටියෙන් කියතොත්, ධනේශ්වර සමාජයේ පොහොර ගොඩේ ඉතාමත් සශ්‍රීක ලෙස දලුලන එම විශේෂ සාහිත්‍යයට සම්බන්ධ න්‍යායන් ගැන මට විශ්වාසයක් නැහැ. ඉන්දියානු මුනිවරයෙකු තම නාභිය දෙස බලාගෙන භාවනාවේ යෙදී සිටිනවා වාගේ නිතරම ලිංගික ප්‍රශ්නවලම එල්බගෙන ඉන්නා අය මා විශ්වාස කරන්නේ නැහැ."**

(137 වැනි පිටුව.)

කාන්තාවන්ගේ විමුක්තිය පෞද්ගලික දේපළ සමඟ ප්‍රාග්ධනයේ සූරාකෑම සමඟ පවුලේ පෞද්ගලික ස්වරූපය සමඟ ගැටගැසී ඇති බව පෙන්වා දෙන ලෙනින්, එය වෙනස් කිරීම සඳහා නීතිරීති පැනවීම කළ යුතුවා මෙන්ම ප්‍රායෝගික පියවරද අවශ්‍ය බව පෙන්වා දෙයි.

**"දෙවැනි සහ ඉතාමත් වැදගත් පියවර නම්, ඉඩම්වල සහ කම්හල්වල පෞද්ගලික අයිතිය අහෝසි කිරීමයි. මෙය සහ මෙය පමණක්ම කාන්තාවගේ සම්පූර්ණ සහ නියම විමුක්තිය දෙසට අවශේෂ, පෞද්ගලික ගෙදර වැඩවල සිට මහා පරිමාණ සමාජවාදීකරණය කරන ලද ගෘහ සේවාවන් දක්වා පරිවර්තනයවීම මගින් ඇය ගෘහස්ථ වහල්භාවයෙන් නිදහස් කර ගැනීමට මාවත විවෘත කරයි."** (116 වැනි පිටුව)

කාන්තා විමුක්තිය පිළිබඳ නිවැරදි, විද්‍යාත්මක ස්ථාවරයක් ගොඩනගා ගැනීමේදී ලෙනින්ගේ මෙම ලිපි මාලාව ඉතාමත් වැදගත් වැඩ කොටසක් ඉටු කරනු ලබයි.



"කාන්තාවට විමුක්තිදායක නීති කොතරම් තිබුණද, ඇය තවදුරටත් ගෙදර වහලියකම වන්නීය. එසේ වන්නේ අවශේෂ ගෙදර වැඩ විසින් ඇය පෙළනු ලබන, ඇයගේ ගෙල සිර කරනු ලබන, ඇය ඔබා තබනු ලබන සහ ඇය කුස්සියටත්, ළදරුවන් බලා ගැනීමටත් බැඳ තබනු ලබන හෙයිනි. එම නිසා ඇයට සිදුවී ඇත්තේ, අමානුෂික තරම් ඵලදායී නොවූද, අවශේෂවූද, මනස්තාපය දල්වන්නාවූද, අවහිර ගෙන දෙන්නාවූද, දාසවැඩ කරමින්, ස්වකීය ශ්‍රමය අපතේ හැරීමටය. කාන්තාවන්ගේ නියම විමුක්තිය, නියම කොමියුනිස්ට් ක්‍රමය ආරම්භ වන්නේ (රාජ්‍ය බලය මෙහෙයවන නිර්ධන පන්තිය යටතේ) මෙම අවශේෂ ගෙදර වැඩට එරෙහිව දැඩිතම අරගලයක් ආරම්භවූ විට නැතහොත්, එය සම්පූර්ණයෙන්ම මහා පරිමාණ සමාජවාදී ආර්ථිකයකට පරිවර්තනයවීම ආරම්භවූ විට පමණකි."

ලෙනින්, කාන්තා විමුක්තිය, 83, 84 පිටු